ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපැල: VanHornNT@state.gov http://lk.usembassy.gov

නිවේදන අංක: 20190507

**2019 රාමදාන් උත්සවය පිළිබඳ ජනාධිපති පණිවිඩය**

මැයි 5, 2019: ශුද්ධ වූ රාමදාන් මාසය සමරන සියලුම මුස්ලිම් ජනතාවට මගේ උණුසුම් සුබ පැතුම්.

මහම්මත්තුමාට ශුද්ධ වූ කුරානය හෙළිදරව් කිරීම රාමදාන් සමයේදී සමරනු ලබයි. අඩසඳ දර්ශනය වීමත් සමගම මුස්ලිම් පවුල් සහ ප්‍රජාව මෙම හෙළිදරව්කිරීම සැමරීම ආරම්භ කරනු ලබන්නේ මාසයක් පුරා අධ්‍යාත්මික ආවර්ජනා, අධ්‍යාත්මික පාරිශුද්ධභාවය ඇතිකර ගැනීම සහ යාච්ඤා කිරීම මගිනි.

රාමසාන් සමයේදී මුස්ලිම්වරුන් උදෑසන සිට සැන්දෑ කාලය දක්වා නිරාහාරව සිටිමින් කුරානයේ පාඨ කියවීම කරනු ලබන අතර, අනුන්ගේ යහපත උදෙසා ත්‍යාගශීලීවීම සහ හොඳහිත පතුරවන කාර්යයන්හිද නිරත වෙයි. එසේ කිරීම මගින්, ඔවුන්ගේ අධ්‍යාත්මික ගමන තුළ අලුත් වූ හැඟීම් වර්ධනය කරගනු ලබයි. එසේම දෙවියන් වහන්සේගේ කරුණාව හා දයාව පිළිබඳ ඔවුන්ගේ ඇති කෘතඥතාව වර්ධනය කරගනු ලබයි.

අපට දැනටමත් ලබා දී ඇති ආශීර්වාද ගැන ආවර්ජනා කිරීමටත්, එකිනෙකා සමග ඇති මිත්‍රත්වය වැඩිදියුණු කර ගැනීමටත් මේ මාසය පුරාම අපට අවස්ථාවක් ලැබී තිබේ. සියලු දෙනාම එක්ව මේ රාමදාන් සමයේ වඩා සාමකාමී හා ගෞරවනීය සමාජයක් ළඟා කරගත හැකිය.

මෙලේනියා හා එක්ව එක්සත් ජනපදයේ සහ ලොවපුරා සිටින මුස්ලිම් ජනතාවට ආශීර්වාදලත් සැමරුම් මාසයකට සුභපැතුම් එවමි.